# "ඉතා වැදගත් පුවතක් (දුටු ගැමුනු රජතුමා ගැන)"



මහා වංශයෙන් ගත් මේ කොටසේ කිසි වෙනසක් නොකෙලෙමි. මෙසේ (ගැමුනු) රජ තෙමේ (තිස්ස) කුමරුට අනුශාසනා කොට තුෂ්නිම්භූත වූයේය.

එකෙණෙහි භික්ෂු තෙමේ ගණ සජ්ඣායනා කළ සේක. දෙවියෝ සදිව්‍ය ලෝකයෙන් රථ සයක් එලවූහ. රථයෙහි සිටියා වු ඒ දෙවියෝ වෙන් වෙන්ව රජහට " මහරජාණෙනි", සිත්කලු වු අප අපගේ දෙව් ලොවට ඔබ අව මැනව" ය් යාච්ඤා කළෝය. රජ තෙමේ ඔවින් බස් අසා "මම යම් තාක් බණ අසම් නම් ඒ තාක් ඉවසව" ය් හස්ත සංඥාවෙන් වැලකුයේය. භික්ෂුහු ගණ සජ්ඣායනාව වලකන්නේය" ය් කියා දේශනාව නැවැත්වූහ. රජ තෙමේ ඒ නැවැත්වීමට හේතු විචාළේය. ඒ භික්ෂුහු "නැවැත්ත මැනවැයි සංඥා දුන් බැවිනැ"ය් වදාළේය. රජ තෙම "ස්වාමීනි,




ඒ එසේ නොවෙ ය් කියා දෙවියන්ට දැන් වූ බව කීයේය. ඒ අසා සමහර දෙනෙක් මරණ භයින් භය වූ මේ තෙමේ වලපනේය"ය් සිතූහ. ඔවින්ගේ සැක දුරලනු පිණිස ඒ අභය ස්ථවිර තෙමේ රජහට වදාරණ සේක් (මහ රජ තොපට) රථ එලවන ලදහය් කෙසේ දැක්විය හැක්කේ ද ය් මෙසේ වදාළ සේක. පණ්ඩිත වූ රජ තෙමේ මල්දම් අහසෙහි දැක්ම විය. ඒ මල් දම් වෙන් වෙන් ව රිය හිස්හි ලැගුණාහු එලුනෝය. මහාජන තෙමේ අහස එලෙන්නා වූ ඒ මල් වඩම් දැක සැක හළේය.

"වහන්ස, කවර දෙව් ලොවක් රම්‍ය දෝ, ය් තෙරුන් විචාළේය.... "මහරජාණෙනි, තුසිත පුරය සිත්කලුයය් ද , සත් පුරුෂයන් විසින් අභිමත යය් ද මහා කරුණා ඇති මෙතේ බෝසත් තෙමේ ද බුදු බව පිණිස කල් බලමින් තුසීපුර වෙසෙය්" වදාල සේක.

මහ පැණැති රජ තෙමේ තෙරුන් බස් අසා මහ සෑය බලමින් ම හොත්තේ ඇස් පියා හෙලීය. එකෙණෙහි ම මෙය්න් චුත ව තුසිත පුරයෙන් එල වු රියෙහි ඉපිද සිට ගත්තේ ය..... මොනවට සරහන ලද තමාගත් බැව් මහජනයාට දක්වනු සඳහා රථයෙහි සිට ගෙණම මහසෑය තුන් යළක් පැදකුණු කොට සෑයත් සංඝයාත් වැඳ තුෂීපුර ගියේය. නාටක ස්ත්‍රීහු මෙහි අවිදින් යම් තැනෙක්හි දී (මළ රජුගේ) ඔටුන්න ගැළවු ද ඒ මෙහි කළශාලා තොමෝ "මකුට මුක්ත මාලා" ය් නම් විය. රජුහු සිරුර දර සෑයෙහි තැබු කල්හි මහාජන තෙමේ යම් තැනෙක්හි දී හැඩුයේද එහි ශාලාව "රාව වර්තී" නම් විය. යම් නිස්සිම මාලකයෙක් හි රජුගේ සිරුර ද වු ද මෙහි එම මාලකය "ර ජමාලක යය් කියනු ලැබේ.

රානාමයට හොබනා වූ ඒ දුටුගැමුණු මහ රජ තෙමේ මෙතේ බුදුහුගේ අග සව් වන්නේය. රජහු පිය තෙමේ ඒ බුදුහු පියද මව් තොමෝ මව් වෙත්. මල් සැදැහැතිස් රජ දෙවන සව් වන්නේය. ඒ දුටුගැමුණු රජු පුත් වු ප්‍රසිද්ධ සාලිය රාජ කමාර මෙතේ බුදුහු පිත් වන්නේය.

(සාදු සාදු සාදු)

(ගෞතම බුදුන්ට මෙන් ම මෙතේ බුදුන්ට ද පුතකු උපදිනු ඇත. ඔහුත් රාහුල තෙරුන් මෙන් මහන වෙතැය් සිතමි.

ගෞතම කුමාරාගේ බිරිය හෙවත් රාහුල කුමරාගේ මව යසෝදරා දේවියය්. මෙතේ කුමරාගේ බිරිය හෙවත් මෙතේ බුදු පුතාගේ මව කවරක් ද යන්න සඳහන් නොකිරීම ලොකු අඩුවකි.)

## සුබස් සිතිවිලි

## චන්ද්‍රිකා - මංගල හා මිස්ට ප්‍රබාකරන්



යාපනේ මහජන රැලියක් ඇමතූ චන්ද්‍රිකා ව්‍යාඝ්‍ර නායක ප්‍රබාකරන් හැඳින්වූයේ මිස්ට ප්‍රබාකරන් යනුවෙනි. ටය්ගර් යනු ව්‍යාග්‍රයාටත් ලෙපඩ් යනු කොටියාටත් ඉංගිරිසීයේ යෙදෙන වචන දෙකය්. ටැමිල් ටර්ගර්ස් යන්න සිංහලට ගත යුත්තේ දෙමල ව්‍යාග්‍රයන් කියා වුවත් "දෙමල කොටි" වියහර දැන් වෙනස් කල නොහැකි විදියට මුල් බැස ගෙන ඇත.

පැරුනි පත පොතේ "දිවි වග වලසුන්" ගැන සඳහන් වන්නේ " කොටි ව්‍යාග්‍ර වලසුන්" ගැන විය යුතුය. වගා-වගෙක්-වගහු යන වියහර ගැනීමට අකමැති වු අපේ ලේකකයන් ව්‍යාග්‍රයන් ද කොටියන් ලෙස සැලකූ බව පෙනේ. දෙමලෙන් පුලි යනු කොටියාය "පුල්ලි" අපට ආවේ දෙමල "පුලි" යන වචනයෙන් විය යුතුය.

අපි මාතෘකාවට බසිමු. මිස්ට, මිසිස්, මිස් ආදි වශයෙන් වචන 8 ක් ඉංග්‍රිරිසියේ බහවිත වෙය්. " මෙනෙවියන්ට" "මිස්" යනුවෙන් වචනයක් ඇතත් " මනව්වන්ට වචනයක් ඉංගිරිසියේ නැත. ඉංගිරිසීන් එබඳු වචනයක් හදා නොගත්තේ ඇය් දැය් කියන්නට මම නොදනිමි. ඉංගිරිසියේ "මිස්ට" යනු සිංහල "මහතා" නොවේ මහා ආත්ම - මහ අත් - මහත් වේ. එය මහතා මහත්හු -මහතෙක් - මහතුන් යනුවෙන් වියහරේ ඇත. මහත්හු ලියන්නට අකමැති අය "වර" පදය එකතු කොට මහත්වරු යන පදය බහවිතා කරති. ඕස්ට්‍රේලියාවේ මිනිස්සුත් ගෑනුත් මිස්-මිසිස්-මිස්ට යන වචන නුරුස්සති. ඔවින් ඒ පද යොදන්නේ පෙලපත් නම බහවිතා කරන විටය.

මිස්ට ඇබට් - මිස්ට ටෝනි ඇබට් කියතත් ටෝනි (තැනැති නම) කියන විට මිස්ට බහවිතා නොවේ. ඉංගිරිසි බාසා රීතිය ලංකාවට නොගැලපේ. "මිස්ට ජයවර්ධන" හරිය. "මිස්ට ප්‍රේමදාස" හරි නැත. එහෙත් මිස්ට රනසිංහ - මිස්ට රනසිංහ ප්‍රේමදාස හරිය.

බයාදුකම, ගැති නිවටකම, හැදිච්චකම, උගත්කම යන කුමන කමක් නිසා හෝ ප්‍රබාකරන්ට මිස්ට ප්‍රබාකරන් යනුවෙන් කියවුනා යය් සිතමු.

චාල්ස් ඩාවින් - කාල්මාක්ස් - මාවොසේ තුං - ලෙනින් - ඔබාමාටත් රුක්මනීදේවී - සිරිමාවෝටත් මිස්ට හෝ මිසිස් යය් නොකියන්නේ ඔවින්ට එය උවමනා නැති නිසාය. මහින්ද රාජපක්ශටත් වේලුපිල්ලේ ප්‍රබාක-රන්ටත් මිස්ට උවමනා නැත. මහින්ද රාජපක්ශ ජනාදිපතිතුමා හැදින්වීමට හැදිච්චකම බලපා නැතත් ප්‍රබාකරන් හැඳින්විමට හැදිච්චකම බලපා ඇත. දෙමල මිනිසුන් පිම්බීමට ප්‍රබාකරන්ට මිස්ට යෙදීම සිංහල චන්ද සැලකිය යුතු ප්‍රමානයක් මෛත්‍රීපාල මහතාට අහිමිවීමට හේතු වී යය් සිතමි.

"ළිඳේ වැටුනාම ගොඩ ගන්න පුලුවං. කටිං වැටුනාම ගොඩ ගන්න බෑ." අපේ අම්මාගේ කියමන ඇත්තය. චන්ද්‍රිකාට සිදු වුයේ එයය්. අප්‍රසන්න දේ යටපත් වන්නට ඉඩ හැරීම හොඳය. එය යලි යලිත් මතු කිරීම හොඳ නැත. ඇය වැඩේ අනා ගත්හ.

"ඉතිං ඒකෙ තියන වැරුද්ද මොකක්ද? ප්‍රබාකරන් මහත්තයට මහත්තයා කීම.... ඉංගිරිස දන්නැති මෝඩ...."ඇය වදුරු බසුන ඉහේ හලා ගත්හ.

දකුනේ රැලියක දී සිංහලෙන් කතා කරන විට ඇය ප්‍රබාකරන් මහත්තයා ගැන කියා හූ පූජාවකට ලක්වීම අරුමයක් නොවේ.

මංගල සමරවීර ද එයට කට ලෑවේ චන්ද්‍රිකා නිදෙ-ාස් කිරීමටය. මේ දෙදෙනාගෙන් ම ඉල්ලීමක් කරමි. "හිස අත ගා අං තිබේදැය් බලනු මැනවි."

බටලන්දේ වදකාගාරය ගැන වේදිකාවේ කියවෙන විට හෝ පුවත් පතක පල වූ විට හෝ ඒ ගැන කතා කිරීමට හෝ උත්තර දීමට රනිල් ඉදිරිපත් නොවන්නේ එසේ සිටීම ශරීර සෞක්කියට හොඳ නිසාය.

Alpha academy
Classes at Dandenong
Selective entry school exam preperation
Primary, Secondary, VCE
2015 Program
Primary & Secondary - Mathematics, Science and English
VCE - Biology, Chemistry
VCE English - Recommended Texts Analytical Writing
Classes conducted by Current School Teachers
Contact - Sarah on 0457 908 918
ABN 52267352093

ACCOUNTING TUTORING
VCE/TAFE/UNI
MATHEMATICS For Kids
(Grade 4 to 8)
• Individual classes
• Small group classes
• Any accounting subject
• Flexible time and home visits
• Reasonable rates
• Based in Dandenong
Popular tutor and former government school teacher in Sri Lanka.
Rushan Silva
MBA/MPA (Deakin)
B.Sc (B.Adm) sp.
Contact : 0430297807 E-mail : maths4kids@outlook.com

විසිහතර පැයේම ඔබ වෙනුවෙන් - තිසර ගුවන්විදුලිය www.thisara.com